සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/04/Circular/2016

ඔබේ අංකය / உமது இல / Your No: ..................

දිනය / திகதி / Date: 2016.03.31

දිවිනැගුම චක්‍රලේඛ අංක :- 2016/ 3

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත.

## දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2016

රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන **" ධාර්මික ගොවිතැනක් නිරෝගීමත් ජනතාවක් "** සහ **පරිසර සංරක්ෂණය** යන වැඩසටහන් වලට සමගාමීව දිවිනැගුම දෙපාර්තමේන්තුව විසින් දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ මේ වසරේ දී දීප ව්‍යාප්තව පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කල යුතුව ඇත.

1. කොළ එළවළු / පලා සහ දේශීය අල බෝග වගා කිරීමේ වැඩසටහන **(වසවිස නැති පලා සහ අල )**
2. වන වගා වැඩසටහන **(සමෘද්ධි වන රොද)**

## 1. කොළ එළවළු /පලා සහ දේශීය අල බෝග වගා කිරීමේ වැඩසටහන

### 1.1. හැඳින්වීම :-

අඩු ආදායම්ලාභී පවුල් වල එදිනෙදා ආහාර අවශ්‍යතාවයන් සපුරා ගැනීමේදී ආර්ථික වශයෙන් සහනයක් සැලසෙන පරිදි සහ ඉහළ පෝෂණයක් තහවුරු වන පරිදි තම ගෙවත්තෙන් නැවුම් පලා වර්ග / කොළ එළවළු සහ දේශීය අල වර්ග කාබනික ක්‍රමයට වගා කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. ඒ අනුව අවම වශයෙන් පලා වර්ග/ කොළ එළවළු වර්ග 05 ක් සහ දේශීය අල වර්ග අවම වශයෙන් 05 ක් වගා කල යුතු වේ.

**අරමුණු**

1. පෝෂ්‍යදායී සමබර හා වස විස නොමැති ආහාර තම ගෙවත්තෙන් පහසුවෙන් ලබා ගැනීම.
2. පවුලේ ආහාර සඳහා කරනු ලබන වියදම් අවම කිරීම.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
011-2883802/2872202
Fax-011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிகபணிப்பாளர்தலைமையதிபதி / Additional DirectorGeneral
011-2871672
Fax-011-2887280
adg@divineguma.gov.lk
anuradhakum@yahoo.com

අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration)
011-2873799
Fax-011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office
011-2872202
011-2887722(Hotline)

## 1.2. සැලසුම් කිරීම

1.2.1. මේ සමග සපයා ඇති ව්‍යාපෘති වාර්තාව (ඇමුණුම් අංක 01) යොදා ගනිමින් සෑම ග්‍රාම නිලධාරී වසමක් සඳහාම සැලැස්මක් සකස් කර ගත යුතුය. මෙහිදී වසමකින් අවම වශයෙන් පවුල් 50 ක් වත් ඇතුලත් කර ගත යුතුය. වසම් මට්ටමේ සැලසුම් අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සැලැස්ම සකස් කරගත යුතුවේ.

1.2.2. කොළ එළවළු / පලා සඳහා රෝපණ ද්‍රව්‍ය ප්‍රදේශයෙන් සපයා ගත යුතු වේ. මේ සඳහා වියදම් දැරීම අපේක්ෂා නොකෙරේ. (උදා:- ගොටු කොළ, මුකුණුවැන්න, තම්පලා, කංකුන්, සාරණ, කොහිල, කතුරුමුරුංගා, නිවිති, අබ, මින්චි, අසමෝදගම් වැනි ප්‍රදේශයට උචිත ඕනෑම පලා වර්ග සහ කොළ එළවළු)

1.2.3. ප්‍රදේශයට උචිත දේශීය අල බෝග සඳහා රෝපණ ද්‍රව්‍ය හැකි තරම් නොමිලේ ලබා ගැනීමට, හුවමාරු කර ගැනීමට කටයුතු කල යුතු වේ. (උදා: - රාජ අල, කුකුලල, දන්දිල, වැල් අල, හිඟුරල, කිරිකොඩොල්, ඉන්නල, ජඹුරල, කහට අල, මඤ්ඤොක්කා, බතල, කිරි අල, කටු අල, හිඟුරල ආදී) අත්‍යාවශ්‍ය විටෙකදී මිලදී ගැනීමට කටයුතු කල හැකිය. මෙහිදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මිල ගණන් නොඉක්මවන පරිදි කටයුතු කල යුතු වේ.

1.2.4. මෙම වගාවන් සඳහා කාබනික පොහොර ගෙවත්ත තුලම නිපදවා ගැනීමට කුඩා පරිමාණයේ ඒකක ඇති කිරීමට ද සැලසුම් කල යුතු වේ.

1.2.5. මේ පිළිබඳව දැනුම්වත් කිරීම් සඳහා වන උපදෙස් ***අංක 3 පොදු උපදෙස්*** යටතේ දක්වා ඇත.

1.2.6. ව්‍යාපෘති යෝජනාව සඳහා දිවිනැගුම ප්‍රජා මූල සංවිධාන නියෝජිතයින්ගේ, තාක්ෂණ/ සහාය සේවා සපයන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මෙන්ම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරගේ සහාය හා උපදෙස් ලබාගත යුතු වේ.

## 1.3. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

1.3.1. දිවිනැගුම සංවර්ධන නිලධාරිගේ සහ කලාප කළමණාකරුගේ මෙන්ම ව්‍යාපෘති / මුලස්ථාන කළමණාකරුගේ නිර්දේශයෙන් හා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව ක්‍රියාත්මක කල යුතු වේ.

1.3.2. පහත දැක්වෙන කාල රාමුවට අනුව ක්‍රියාත්මක කල යුතුය.

i. දැනුම්වත් කිරීම හා සැලැස්ම සකස් කිරීම. - අප්‍රේල් 25 ට පෙර
ii. පලා / කොළ එළවළු හා අල වර්ග වගා කිරීම. - මාර්තු 31 සිට මැයි 05
iii. කොම්පෝස්ට් ඒකක සකස් කිරීම - මාර්තු 31 සිට මැයි 31
iv. වගාව අඛණ්ඩව පවත්වාගෙන යාම. - මාර්තු 31 සිට වසර පුරා
v. ප්‍රගතිය වාර්තා කිරීම. - 2016 අප්‍රේල් සිට 2017 දෙසැ.

## 2. වන වගා වැඩසටහන (සමෘද්ධි වන රොද)

### 2.1.හැඳින්වීම :-

1881 වර්ෂයේ blue book වාර්තාවට අනුව එවකට ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් වන වැස්ම 84%ක් විය. එහෙත් විවිධ පාරිසරික, හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මේ වනවිට එම වනාන්තර ප්‍රමාණය සීඝ්‍රයෙන් අඩුවී ඇත. 2012 වනවිට මෙම අගය 29.43%කි. එබැවින් රටේ වන ගහනය වර්ධනය කිරීමේ ජාතික අවශ්‍යතාවයට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ දායකත්වය ඉහළ නැංවීමට මෙමගින් කටයුතු කල යුතු වේ.

**අරමුණු :-**

1. පරිසර සංරක්ෂණයට ඉහළ දායකත්වයක් ලබාදීම.
2. දැව හා ආහාර නිෂ්පාදනය තුලින් ආර්ථික වර්ධනයට දායකත්වයක් ලබාදීම.
3. වන වගාව හා පරිසර සංරක්ෂණය පිළිබඳ ආකල්ප සංවර්ධනය.
4. වගාවන් නොමැති භූමි සම්පත ඵලදායී ලෙස යොදා ගැනීම.

### 2.2. සැලසුම් කිරීම

2.2.1. මේ සමග සපයා ඇති ව්‍යාපෘති වාර්තාව (ඇමුණුම් අංක 02) යොදා ගනිමින් සෑම ග්‍රාම නිලධාරී වසමක් සඳහාම සැලැස්මක් සකස් කර ගත යුතුය. මෙහිදී අවම වශයෙන් පැල 50 ක් වත් රෝපණය කල යුතු වේ. එම සැලසුම් පදනම් කරගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සැලැස්ම සකස් කරගත යුතු වේ.

2.2.2. ප්‍රදේශයේ ස්වභාවිකව වැවෙන පැල සපයා ගැනීම. බීජ තවාන් කර ගැනීම මගින් රෝපණ ද්‍රව්‍ය සපයා ගැනීම කල යුතු වේ. අත්‍යාවශ්‍ය විටෙකදී පමණක් පැල මිලදී ගැනීම කල හැකිය.

2.2.3. මාර්ග, වෙරළ තීරය, පූජනීය ස්ථාන, අධ්‍යාපනික ආයතන, වාරි මාර්ග වැනි පොදු භූමි ආශ්‍රිතව මෙන්ම අඩු ආදායම්ලාභීන්ගේ ගෙවතු / ඉඩම් වල වන වගාව ප්‍රවර්ධනය කල යුතු වේ.

2.2.4. මේ පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා වන උපදෙස් ***අංක 3 පොදු උපදෙස්*** යටතේ දක්වා ඇත.

2.2.5. පැල සිටුවන භූමි, අදාල තාක්ෂණික සේවා සැපයීම වැනි විෂයයන්ට අදාල වන අනෙකුත් ආයතන වල නිලධාරීන්ගේ නිර්දේශ ව්‍යාපෘති වාර්තාවට ලබා ගත යුතුය.

2.2.6. සමෘද්ධි සමිතිය, ගොවි සංවිධානය වැනි ප්‍රජා සංවිධාන වල නිර්දේශ ද අත්‍යාවශ්‍ය වේ.

### 2.3. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය.

2.3.1. දිවිනැගුම ප්‍රජා මූල සංවිධාන නියෝජිතයෙකුගේ, පැල සිටුවීමට නියමිත පොදු භූමි අයත් වන ආයතන වල නිලධාරීන්ගේ හා දිවිනැගුම සංවර්ධන නිලධාරිගේ නිර්දේශයෙන් ඉදිරිපත් වන ව්‍යාපෘති වාර්තා අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ වාර්තාව අදාල කලාප කලමණාකරු හා ව්‍යාපෘති/ මූලස්ථාන කළමණාකරුගේ නිර්දේශයෙන් හා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් ක්‍රියාත්මක කල යුතු වේ.

2.3.2. පැල වර්ග රජයේ අදාල ආයතන වලින් නොමිලේ ගෙන්වා ගත හැකි නම් ඒ සඳහා කටයුතු කල යුතු වේ. මෙහිදී ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අවශ්‍ය විය හැකි පැල ප්‍රමාණයන් සපයා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් / දිවිනැගුම මූලස්ථාන කළමණාකරුගේ ප්‍රධානත්වයෙන් අදාල රාජ්‍ය/ අර්ධ රාජ්‍ය ආයතන සමග සාකච්ඡා කර තීරණ ගැනීම වැදගත් වේ.

2.3.3. පැල මිලදී ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ව්‍යාපෘති වාර්තාව මඟින් නිර්දේශ ලබාගෙන ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව අදාල වසමටම පැල සැපයෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කල යුතුය.

2.3.4. මෙහිදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මිල ගණන් පදනම් කර ගෙන එය නොඉක්මවන පරිදි දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ පැල තවාන් වලින් පැල මිලදී ගැනීමට කටයුතු කල හැක්කේ නම් වඩාත් සුදුසු වනු ඇත.

2.3.5. කාල රාමුව

| අනු අංකය | විස්තරය | වන වගා වැඩසටහන | |
|---|---|---|---|
| | | තෙත්/ අතරමැදි කලාප | වියලි කලාපය |
| 1 | නිලධාරීන් දැනුම්වත් කිරීම | මාර්තු 31 - අප්‍රේල් 25 | මාර්තු 31 - අගෝස්තු 25 |
| 2 | ප්‍රතිලාභීන් හඳුනා ගැනීම හා දැනුම්වත් කිරීම | මාර්තු 31 - අප්‍රේල් 25 | මාර්තු 31 - අගෝස්තු 25 |
| 3 | ග්‍රාමීය සහ ප්‍රාදේශීය සැලැස්ම සකස් කිරීම | මාර්තු 31 - අප්‍රේල් 30 | මාර්තු 31 - අගෝස්තු 25 |
| 4 | සැලැස්මට අනුමැතිය ලබා ගැනීම | අප්‍රේල් 1 - අප්‍රේල් 30 | මාර්තු 31 - අගෝස්තු 25 |
| 5 | රෝපණ ද්‍රව්‍ය සපයා ගැනීම / තවාන් කිරීම | අප්‍රේල් 1 - මැයි 10 | මාර්තු 31 - සැප්තැම්බර් 30 |
| 6 | පැල සිටුවීම, ආරක්ෂිත වැට සැකසීම | අප්‍රේල් 1 - මැයි 10 | සැප්. 01 - ඔක්. 30 |
| 7 | අඛණ්ඩව නඩත්තු කිරීම | අඛණ්ඩව | |
| 8 | පසු විපරම /අධීක්ෂණය / ප්‍රගති වාර්තා කිරීම | 2016 අප්‍රේල් සිට 2017 දෙසැම්බර් | |

## 3. පොදු උපදෙස්

මෙම කරුණු ඉහත 1 හා 2 යන වැඩසටහන් දෙකටම අදාල වේ.

1. දිස්ත්‍රික් / ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සහ කෘෂිකර්ම කමිටු ආදී රැස්වීම් මෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පැවැත්වෙන විවිධ රැස්වීම් භාවිතා කර නිලධාරීන් දැනුම්වත් කිරීම කල යුතු වේ.

2. ග්‍රාමීය මට්ටමේ දී ආගමික නායකයින්, නිලධාරීන්, ප්‍රජා සංවිධාන නියෝජිතයින් සහ ප්‍රතිලාභීන් දැනුම්වත් කර ඉහත වැඩසටහන් දෙක සඳහා වෙන වෙනම සැලසුම් සකස් කිරීම අවශ්‍ය වේ. අත්‍යාවශ්‍ය වන්නේ නම් පමණක් මේ සඳහා වන රැස්වීම් එකක් හෝ කීහිපයක් සඳහා වසමකට රු. 1000/- කට නොවැඩි වන ලෙස සංග්‍රහ ඇතුළු අනෙකුත් වියදම් දැරිය හැකිය.

3. විශේෂයෙන් පලා / කොළ එළවළු වගාව සහ දේශීය අල බෝග වගාව අඛණ්ඩව එළඹෙන වසරටත් පවත්වාගෙන යාම සලකා බලා හොඳම ප්‍රතිලාභීන් තෝරා ත්‍යාග ප්‍රදානය කර ඇගයීමට අපේක්ෂා කර ඇත. ඇගයීම් කරනු ලබන අවස්ථාවේ මෙම වැඩසටහනට බද්ධව පවුල් 50 ක් වත් සිටිය යුතු අතර හොඳම ප්‍රතිලාභීන් තේරීම සඳහා වන නිර්ණායක නියමිත කාලයේදී ඔබ වෙත ලබාදීමට නියමිතය.

4. මෙම වසරේ වගාවෙන් ලබාගන්නා රෝපන ද්‍රව්‍ය, යොදා ගෙන නැවත වගා කර ගැනීමට හැකිවන පරිදි මෙම වගාව පවත්වාගෙන යා යුතු වේ. වන වගා ව්‍යාපෘතිය ද එලෙසම ඉදිරි වසර වලත් අඛණ්ඩව පවත්වාගෙන යා යුතු වේ.

5. ඉහත වැඩසටහන් දෙකෙහිම කාර්යය සාධනය මෙන්ම සමස්ථ ජීවනෝපාය සංවර්ධන කාර්ය සාධනය සලකා බලා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේදී හොඳම ග්‍රාම නිලධාරී වසම තෝරා ජීවනෝපාය සංවර්ධනයට විශිෂ්ටතම දායකත්වය ලබාදීම වෙනුවෙන් එහි දිවිනැගුම සංවර්ධන නිලධාරී ඇගයීමට ලක් කිරීමට ද අපේක්ෂා කර ඇත. මේ සඳහා වන නිර්ණායක ඇතුළු උපදෙස් ලබන වසරේදී ඔබ වෙත ලබාදීමට නියමිතය.

## 4. ප්‍රතිපාදන හා පරිපාලන වියදම්

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය මට්ටමේදී අනුමත ව්‍යාපෘති වාර්තා අනුව අත්‍යාවශ්‍ය මිලදී ගැනීම් සඳහා වන ඉල්ලීම් ඔබ වෙත ගෙන්වා ගෙන ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හා මුදල් අග්‍රිම අදාල ප්‍රාදේශීය ලේකම් වෙත යැවීම වඩාත් සුදුසු වේ. ඒ අනුව මේ සඳහා දිස්ත්‍රික්කයට වෙන් වන ප්‍රතිපාදන ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල විභවතාවයන් / අවශ්‍යතාවයන් පිළිබඳව මනා සමාලෝචනයකින් යුතුව කළමණාකරණය කර ගැනීම අපේක්ෂා කෙරේ.

ආකෘති පත්‍ර 3 මගින් අවශ්‍ය අග්‍රිම ලබා ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලයට ඉල්ලීම් ඉදිරිපත් කල යුතු වේ.

දරණු ලබන වියදමින් 1.5% ක් පරිපාලන වියදම් ලෙස දැරීමට හැකිය. එය 0.5 % ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ද 1 % ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් සඳහා ද බෙදී යන පරිදි විය යුතු වේ.

## 5. මෙහෙයුම් හා ඇගයුම් ක්‍රියාවලිය.

5.1. මේ සමග ඇති ප්‍රගති ආකෘති පත්‍ර අංක 1-1 හා 2-1 යොදා ගෙන දිවිනැගුම සංවර්ධන නිලධාරී විසින් ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ ප්‍රගතිය කලාප කළමණාකරු මගින් ව්‍යාපෘති / මූලස්ථාන කළමණාකරු වෙත මාසිකව ඉදිරිපත් කල යුතුය.

5.2. ප්‍රගති ආකෘති පත්‍ර අංක 1-2 හා 2-2 යොදා ගෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රගතිය මූලස්ථාන කලමණාකරු විසින් ප්‍රාදේශීය ලේකම් මගින් දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත වාර්තා කල යුතු වේ.

5.3. ප්‍රගති ආකෘති පත්‍ර අංක 1-3 , 2-3 හා 4 මගින් දිස්ත්‍රික් මට්ටමේ මාසික ප්‍රගතිය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් එළඹෙන මස 02 වෙනි දිනට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුවේ. (jeevonopaya@gmail.com, divinegumalh@yahoo.com), ෆැක්ස් අංක 011-2872253, 0112872201)

5.4. මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඊ - දිවිනැගුම ව්‍යාපෘතියේ (e - divineguma Project) ඇති ව්‍යාපෘති හා වැඩසටහන් කලමණාකරණ මොඩියුලයට (Project & Programme Management Module) ඇතුලත් කිරීමටත් ප්‍රගතිය නිසි පරිදි නියමිත දිනටම යාවත් කාලීන කිරීමට ව්‍යාපෘති කළමණාකරු කටයුතු කල යුතු වේ.

5.5. මෙම වැඩසටහන් පිළිබඳව අහඹු ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කර එහි වාර්තාවන් අනුව කටයුතු කිරීමටත් එම වාර්තාවන් සහ ඉදිරියට ගන්නා ලද ක්‍රියා මාර්ග පිළිබඳව මා වෙත වාර්තා කිරීමටත් අඛණ්ඩව කටයුතු කල යුතු වේ. තවද නිවැරදි ප්‍රගති වාර්තා ලබා ගැනීමත් විධිමත්ව ගොනු කර තබා ගැනීමත් එලඹෙන වසරේදී සිදු කිරීමට නියමිත ත්‍යාග ප්‍රදානයන් හා ඇගයීමට ලක් කිරීම සඳහා අත්‍යාවශ්‍ය වනු ඇත.

මෙම චක්‍රලේඛය පිළිබඳව වැඩිදුර විස්තර අවශ්‍ය වුවහොත් දුරකථන අංක 011-2873801, 011-2869824 මගින් මෙම කාර්යාලයේ ජීවනෝපාය සංවර්ධන අංශය අමතන මෙන් කාරුණිකව දන්වමි.

මෙම වැඩසටහන් සාර්ථක කර ගැනීමට ඔබ ඇතුළු නිලධාරීන්ගෙන් ලැබෙන සහාය ඉතා අගය කරමි.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු අමාත්‍ය ,
   එස්. බී. දිසානායක මැතිතුමා -කා.දැ.ගැ.පි.
2. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
3. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
4. ලේකම්, මහවැලි හා පරිසර සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
5. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
6. අතිරේක ලේකම් ( ග්‍රාමීය සං.) සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
7. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
8. ප්‍රධාන ගණකාධිකාරී, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.හා අ.ක.ස.
9. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
10. සියළුම අංශ ප්‍රධානීන්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
11. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
12. සියළුම දිවිනැගුම මුලස්ථාන කලමණාකරුවන් - අ.ක.ස. හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු කළමණාකරුවන් සහ දිවිනැගුම සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා